# Maxies Social Movement
## Wennappuwa

### නිදහස් සංවාද වැඩබිම - EAT 1

'සංවාදය' කියන්නෙ නිකං කතා කර කර ඉන්න එකට කියල කෙනෙකුට හිතෙන්න පුළුවං වුණත් ඒක එහෙම නෙවෙයි. සංවාදය කියන යෙදුමට සමාන අදහස දෙන ඉංග්‍රීසි යෙදුම තමයි Dialogue. ඒ කියන්නෙ පාර්ශ්ව දෙකක් හෝ කීපයක් අතර නිශ්චිත ආකෘතියක් ඇතුළෙ කෙරෙන සාකච්ඡාවක්. අදහස් හුවමාරුවක්.

'නිදහස්' දේශපාලනික මාධ්‍ය ව්‍යාපාරය 'සංවාද වැඩබිමක්' කියල මේ යෝජනා කරන්නෙ ඊටත් එහා යන දේශපාලන ක්‍රියාවලියකට. කියවීම, හැදෑරීම, අභ්‍යාස කිරීම, පර්යේෂණ කිරීම, ගවේෂණය කිරීම, කතා කිරීම, සවන් දීම, ප්‍රශ්න කිරීම, පිළිතුරු දීම, වාද කිරීම... මේ හැමදේම යෝජිත සංවාද වැඩබිමට අදාළයි. මෙතන අරමුණක් තියෙනව. හැබැයි අරමුණ තමයි භාවිතය. භාවිතය වඩා යහපත් ගොඩනැගීම් සඳහා. යහපත සහ අයහපතත් ආයෙත් සාපේක්ෂයි.

මේ සංවාද වැඩබිම ඇතුළෙ පුද්ගලිකත්වය බිඳෙන පොදු ගතියක් ඇතිවෙනව. එතකොට හිත් රිදවීම්, කැළඹීම්, කළකිරීම්... වගේ හුඳු පුද්ගලික සංසිද්ධීන්වලටත් මුහුණ දෙන්න වෙනව. ඒ, සංවාද වැඩබිමේ යෝජනාව සංකීර්ණ නිසා. කරන්න තියෙන්නෙ පැහැදිලි අවබෝධයක් එක්ක ඉස්සරහට ම යන එක. 'පුද්ගලික' වෙනුවට 'පොදු' ආදේශ වෙන තැන මෙතැන නිසා ප්‍රශ්නයක් ඇති වුණත් ඒක බේර ගන්න අමාරු වෙන එකක් නැහැ.

දශකයකට ආසන්න කාලයක් තිස්සෙ 'නිදහස්' හරහා කෙරෙමින් තිබෙන මේ ඓතිහාසික අත්හදා බැලීම ගැන 'කුඹී' පොතේ සෑහෙන ප්‍රමාණයකට විස්තර කෙරෙනවා.

Maxies ව්‍යාපාරයේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ මැක්සි පෙරේරා මහතා සමග ගොඩනැගෙන ඉතාමත් ම විධිමත් සාකච්ඡාවක් ඇතුළෙ තමයි Maxies Social Movement නිර්මාණය වෙමින් අපේ සංවාද වැඩබිම මේ විදිහට තව තවත් පුළුල් වෙන්නෙ. මේ ගැනත් 'කුඹී' පොතේ සවිස්තරාත්මකව සඳහන් වෙනව.

නිදහස් සංවාද වැඩබිමේදී අතිශය වැදගත් සාධකය බවට පත්වෙන්නෙ 'දැනුම'. දැනුම, ඥානය සහ ප්‍රඥාව අතර තියෙන සම්බන්ධතා ගැනත් ඊළඟට සාකච්ඡා කරන්න නියමිතයි.

### 'දැනුම' කියන්නෙ මොකද්ද?

දැනුම කියන්නෙ ඓතිහාසික වශයෙන් සාකච්ඡාවට ගැනෙන ඥානය. යෙදුම ඉංග්‍රීසි භාෂාවට ගත්තොත් Knowledge. දැනුම තමයි ලෝකය වෙනස් කරන්නෙ. හැබැයි ඒ වෙනස් කිරීම යහපත සඳහාද අයහපත සඳහා ද කියන ප්‍රශ්නය අප ඉදිරියේ තියෙනවා. දැන් එතකොට යහපත සහ අයහපතත් සාපේක්ෂයි. කොහොම වුණත් මේ සමානකම් සහ වෙනස්කම් තේරුම් ගන්නත් අවශ්‍ය වෙන්නෙ දැනුම තමයි.

අපි ගැහැනු මිනිස්සු විදිහට වෙන වෙනම ඉපදිලා ජීවත් වුණත්, පවුල් විදිහට එකතු වෙලා ජීවිතයට මුහුණ දුන්නත් පොදුවෙ අප අවට සිද්ධ වෙන දේවල්වලින් ගැලවිලා ඉන්න විදිහක් නැහැ. ඒ කියන්නෙ අපි හැමවෙලාවෙම සමස්ත ලෝකයේම කොටසක්. අවට තැනක සිද්ධ වුණත් ඈත තැනක සිද්ධ වුණත්, අපි දැනුවත්ව සිද්ධ වුණත් නොදැනුවත්ව සිද්ධ වුණත් ඒ සිද්ධ වෙන හැම දෙයක්ම එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා හැමවෙලාවකම අපි ජීවත් වෙන්නෙ අන්න ඒ බලපෑම ඇතුළෙ. තෘප්තිමත් මිනිස්සු විදිහට, සාර්ථක පවුල්කාරයො විදිහට හෝ ප්‍රීතිමත් සමාජ හැටියට අපිට පවතින්න පුළුවං වෙන්නෙ මේ සරල සත්‍ය, එහෙමත් නැත්තං මුළු විශ්වයටම අදාළ පැහැදිලි යථාර්ථය අවබෝධ කරගත්තොත් විතරයි.

අපි දන්න සහ නොදන්න හේතු ගණනාවක් නිසා දැනුම ගැන තියෙන දැනුම අපිට අඩුයි. ඒ යෝජනාව නිසා අපේ පුද්ගලික පෞරුෂය අභියෝගයට ලක්වුණත් ඇත්ත ඒක තමයි. අනිත් පැත්තෙන් දැනුම කියන්නෙ පාසල් සහ විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතනවලට විතරක් අදාළ සුවිශේෂ යමක් කියල හිතෙන ගතියකුත් අපිට තියෙනව. හිතෙනව කිව්වට ඒක පොදු එකඟතාවක්. එහෙමත් නැත්නම් පොදු සම්මතයක්. මේ කාරණය ඇත්ත ම නෙවෙයි. ඔය කියන ආයතන ඇතුළෙ නිෂ්පාදනය කරන දැනුම අත්‍යවශ්‍ය බවත් ඒ දැනුම් පද්ධති සමස්ත සමාජයෙ බුද්ධි ප්‍රබෝධය ඇති කරන බවත් අනිවාර්ය තත්ත්වයක්. ඒත් ඒ වගේම ඊට පිටින් වර්ධනය වෙමින් ඉස්සරහට යන අධ්‍යාපන ධාරා ගණනාවකුත් තියෙන බව අපි තේරුම් ගන්න ඕන. කොටින්ම දැනුම

නිෂ්පාදනය වෙන්නෙ විවිධ මිනිස් ක්‍රියාකාරකම් එක්ක. ඇත්තටම සිද්ධ වෙන්නෙ යම් ක්ෂේත්‍රයක විධිමත් සංවිධානගතවීමක් නිසා අදාළ දැනුම යම් අධ්‍යාපනික ආකෘතියකට වැටෙන එකයි. මේ නිසා අර කලින් කියපු පාසල් සහ විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතන තුළ වගේම ඉන් පිටතදීත් දැනුම නිෂ්පාදනය වෙලා පෝෂණය වන බව අපි තේරුම් ගන්න ඕන.

තවත් විදිහකට ගත්තොත් ඉගෙන ගන්නවා කියන්නෙ ජීවත්වෙනවා කියන එක. ජීවත් වෙනවා කියන්නෙ ඉගෙන ගන්නවා කියන එක. ඉතිං අපේ ඉගෙනීම පටන් ගන්න හොඳ ප්‍රශ්න දෙකක් තියෙනව;

- මම මොනවද කරන්නෙ?
- මා අවට මොනවද සිද්ධ වෙන්නෙ?

**දැනුමත් සංවාදයක්...**

මානව ශිෂ්ටාචාරයෙ වසර දහස් ගණනක ඉතිහාසය හරහා විකාශය වන දැනුම ක්‍රි.පූ. 6වෙන සියවස වගෙ වෙනකොට තවදුරටත් විධිමත් වෙන්න පටන් ගන්නව. යුරෝපීය ඇසින් බලනකොට නං මේ තීරණාත්මක තැන විදිහට සැලකෙන්නෙ ග්‍රීසිය. ක්‍රි.පූ. 624 - 546 අතර කාල පරිච්ඡේදයෙදි බිහිවන තේල්ස් මුණගැහෙන්නෙ ඒ හරියෙදි තමයි. තවත් පැත්තකින් ගත්තොත් දැනුම පිළිබඳ මේ සංවිධානගත වීම සිද්ධ වෙන්නෙ පැරණි භාරතීය පොළොවෙ කියන තර්කයත් නොසලකා හරින්න බැහැ. පැරණි චීනය ගැනත් එවැනි කතා බහ තියෙනව. ඒ අතරෙ සත්‍ය ගවේශනය පිළිබඳ ඓතිහාසික භාරතීය සොයා යෑම් සඳහා විශේෂ තැනක් ලැබෙනව. ක්‍රි.පූ. 6වෙන සියවසේදී, ඒ කියන්නෙ ක්‍රි.පූ. 563 - 483 අතර කාලයෙ බිහි වන බුදුන් එතනදි කැපිල පේනව. ඒත් බුදුන්, වෙනම දැනුම් පද්ධතියකට අදාළව සාකච්ඡාවට ගන්න වෙන හින්ද කොහොමත් අපිට පටන් ගන්න වෙන්නෙ ග්‍රීසියෙන් ම තමයි. ඒ වගේම තේල්ස් හරහා ප්‍රකාශයට පත්වෙන දැනුම බැබිලෝනියානු ශිෂ්ටාචාරයෙන් උපුටා ගත් බව කියැවෙන නිසා තත්ත්වය ටිකක් සංකීර්ණයි.

කොහොම වුණත් තේල්ස් අහන, විශ්වයේ මූලධාතුව කුමක්ද? කියන ප්‍රශ්නය මුල්ම දර්ශනවාදී ප්‍රශ්නය හැටියට පිළිගන්න එක සාධාරණයි. දර්ශනය (Philosophy) කියන දැනුම් පද්ධතියට පදනම වැටෙන්නෙ මේ හරියෙදි කියන එක ගැනත් බරපතල විවාදයක් තියෙන්න බැහැ. ඊට පස්සෙ තේල්ස් පසුපස හිටගන්න දාර්ශනිකයින් පෙළක් ගැන ඉතිහාසයෙ සඳහන් වෙනව.

ඔය වෙනකොට 'ප්‍රඥාව' පිළිබඳවත් සංකීර්ණ කතා බහ පටන් අරගෙන තිබුණ. සොක්‍රටීස්, ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්ගෙ අවධිය වෙනකොට දැනුම පිළිබඳ මේ ගවේශනය තව තවත් තීව්‍ර මට්ටමකට එන්න පටන් ගන්නව. තේල්ස් පටන් ගන්න විශ්වය පිළිබඳ දර්ශනය (Philosophy of the Universe) මේ වෙනකොට මනුෂ්‍යයා පිළිබඳ දර්ශනය (Philosophy of Man) බවට පත්වෙනව. දර්ශනය යනු මූලික හේතුන් (Causes) පිළිබඳ ඥානය (Knowledge) ලබා ගැනීම හැටියටයි විග්‍රහ කෙරෙන්නෙ. ඥානය කියන්නෙ අපි මේ කතා කරන 'දැනුම' ම තමයි කියල තර්ක කෙරුවොත් ඒකට විරුද්ධ වෙන්න හේතුවක් නැහැ. ඇත්තටම Philosophy (දර්ශනය) කියන වචනය ඉදිරිපත් කරන්නෙ සොක්‍රටීස්ට කලින් හිටපු පෛතගෝරස්. ඒ අනුව දර්ශනය කියන්නෙ ප්‍රඥාවට. සොක්‍රටීස්ට අනුව 'ඥානය වනාහි සාධුත්වය'යි (Knowledge is Goodness). හැබැයි ඔහු ම තවත් තැනකදි ඊට විරුද්ධ අදහසත්, ඒ කියන්නෙ ඥානය වනාහි සාධුත්වය නොවේ කියන අදහසත් ඉදිරිපත් කරන හින්ද එතන විසංවාදයකුත් තියෙනව. ඔහුගෙ හොඳම ගෝලයා විදිහට සැලකෙන ප්ලේටෝ මේ දැනුම තවදුරටත් ප්‍රශ්න කරමින් සාකච්ඡාව ඉස්සරහට ම අරගෙන එනව. ඒ වෙනකොට ඥානය කියන්නෙ සාධුත්වය නෙවෙයි කියන තර්කය ඉස්සරහට ඇවිත්. දැන් ඔන්න දැනුම ගැන තව තව මාන මතුවෙන්න පටන් ගන්නව. ප්ලේටෝගෙ අදහසක් අනුව ආරම්භ කරන 'ඇකඩමි' නැමති ආයතනය මේ දර්ශනවාදී ගමන් මාර්ගය ඉතාමත් ම සංවිධානාත්මක තැනකට ඔසවා තබනව. 'එක්කො පාලකයා දාර්ශනිකයෙකු විය යුතුයි, නැත්නම් දාර්ශනිකයෙකු පාලකයා විය යුතුයි', යුතෝපියානු ආකෘතියක් ඇතුළෙ වුණත් ප්ලේටෝ එහෙම කියන්නෙ දැනුම පිළිබඳ බරපතල අවබෝධයක් ඇතුව වෙන්න ඕන. ඊළඟට ඇරිස්ටෝටල්. ඔහුත් මේ දර්ශනවාදී ඉතිහාසය ඇතුළෙ තීරණාත්මක සාධකයක්. හැබැයි දැනුම පිළිබඳ මේ ඉතිහාසය පරිපූර්ණ එකක් නෙවෙයි. පරිණාමීය ක්‍රියාවලියක කොටසක්. අදටත් ඒක අදාළයි. ඒ අදාළත්වය යටතෙ තවදුරටත් විකාශය වන මානව ශිෂ්ටාචාරයෙ සියලුම නූතන දැනුම් පද්ධතිවලට මූලික විද්‍යාත්මක පදනමක් වැටෙන්නෙ මෙන්න මේ ග්‍රීක - රෝම දාර්ශනික කාල තීරුවෙදි කියන එක නං අපි කාටවත් නොසලකා හරින්න බැහැ.

මුල් කාලයෙදි දර්ශනවාදය සහ විද්‍යාව කියල ක්ෂේත්‍ර දෙකක් තිබුණෙ නැහැ. තිබුණෙ දර්ශනවාදී දැනුම් ආකෘතියක් විතරයි. පස්සෙ කාලයක විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් කෙරෙන විග්‍රහයන් ඇතුළෙ සමාජයීය විද්‍යාවන් (Social Sciences) සහ ස්වභාවික විද්‍යාවන් (Natural Sciences) හැටියට මේ ඓතිහාසික දැනුම් පද්ධතිය වෙන් වෙලා තවදුරටත් වර්ධනය වෙනව.

අපේ සංවාද වැඩබිම ඇතුළෙ මූලික තැන ගන්නෙ සමාජයීය විද්‍යාවන්. ඒ කියන්නෙ සමාජ

විද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, මානව විද්‍යාව.... වගේ විෂයයන්. ඒ වගේම රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව.... වගේ රසායනාගාර කේන්ද්‍ර කරගත්ත විද්‍යාවන්ගෙ ආලෝකයත් මෙතනට අවශ්‍යයයි. ආයෙත් ග්‍රීක ඉතිහාසයට ගියොත් අර කලින් කියපු පෛතගෝරස් කියන්නෙ ගණිතය හරහා විශ්වය විශ්ලේෂණය කරපු දාර්ශනිකයෙක්. එතනින් ම පේනවා මේ කිසිවක් කිසිවිටකත් එකිනෙකින් වෙන් කරන්න බැරිබව. වඩා සාර්ථක ක්‍රමය තමයි එකකින් තව එකක් විශ්ලේෂණය කරගන්න උත්සහ කරන එක. තහවුරු කරගන්න උත්සහ කරන එක.

කොහොම බැලුවත් දැනුම කියන්නෙ කොන්ක්‍රීට් ආකෘතියක් නෙවෙයි. වෙනස් වෙමින් විකාශය වන මානව හැකියාවක්. ඉතිං වඩා යහපත් ලෝකයක් ගොඩනගා ගන්න නං දැනුම අත්‍යවශ්‍ය බව පැහැදිලියි.

යෝජිත සංවාද වැඩබිම ගැන තවත් පැහැදිලි කරගන්න, මේ උපුටා දක්වන්නෙ පසුගියදා ප්‍රකාශයට පත් වුණු 'කුඹී' පොතේ පෙරවදන;

**මම මගෙන් ප්‍රශ්න කරනව.**

'මම' කියල කෙනෙක් නැහැ. ඒ, හැමදේම හැමවිටම වෙනස් වෙන නිසා. විශ්වයෙ තියෙන නොවෙනස් වීම තමයි වෙනස් වීම. මේ විශ්ලේෂණයෙ විද්‍යාව තමයි බුදුදහම. එහෙම බලනකොට මම කියන්නෙ ක්‍රියාවලියක්.

දේශපාලනික විග්‍රහයකට ගියත් 'මම' කෙනෙක් පවතින්න බැහැ. පුද්ගලයා කියන්නෙ මානව ශිෂ්ටාචාරයෙ කොටසක්, සමාජ නිෂ්පාදනයක්. එතකොට 'මම' කියන්නෙ බැඳීම් සමූහයක්, උවමනාවන් ගොන්නක්, අරමුණු රාශියක්, ඓතිහාසික ආශාවන්ගෙ එකතුවක්... ඔය විදිහට ගත්තොත් 'මම' වෙනුවට 'අපි' ආදේශ කරන එක තමයි වඩා දේශපාලනික. මම කියල කෙනෙක් ගන්න බැරි නං මට ඕන දේ ගැන අහන එකෙත් තේරුමක් නැහැ. ඒකත් අර ක්‍රියාවලියෙම කොටසක්. තවත් ඉස්සරහට ගිහිං අරමුණ ගැන කතා කෙරුවොත්, අරමුණක් නැහැ. ඒ ක්‍රියාවලියෙ භාවිතය ම තමයි අරමුණ.

ලෝකය විශ්වයෙ කොටසක්. විශ්වයෙ පැවැත්ම තමයි වෙනස් වීම. ඒ වගෙම නිරපේක්ෂ කිසිම දෙයකුත් නැහැ, හැමදෙයක්ම සාපේක්ෂයි. අපි පොළොවෙ කොටසක් විදිහට පවතින නිසාම 'කාලය' අපිව පටලවනව. අතීතය, වර්තමානය සහ අනාගතය අතරෙ අපි අතරමං වෙලා. කාලය කියන්නෙ එක ධ්‍රැවයක සිට අනිත් ධ්‍රැවයට ගමන් කරන රේඛීය සංසිද්ධියක් කියල අපිට දැනෙන්නෙ ඒ නිසයි. ඔළුව පිටිපස්සෙ අතීතය, ඔළුවෙන් ඉස්සරහට අනාගතය. මේක මිථ්‍යාවක්. අපිට හුරු වචනවලින් 'විද්‍යාව' හරහා මේ පැවැත්ම විග්‍රහ කරන්න උත්සහ කෙරුවොත් 'කාලාවකාශය' වගෙ යෙදුමක් තමයි මෙතනට ගැළපෙන්නෙ. වෙනස් වීමත් මෙතනට කෙළින්ම අදාළයි.

වඩා යහපත් ලෝකයක් ගොඩනගාගැනීම ගැන අපිට කතා කරන්න වෙන්නෙ මෙන්න මේ සංකීර්ණ සංවාද සන්දර්භය ඇතුළෙ.

කාලය ඇඟට දැනෙන විදිහට ගත්තොත් ලෝකය වෙනස් කිරීම පිළිබඳ දාර්ශනික තලයෙ සාකච්ඡාව ක්‍රිස්තු පූර්ව අවධියේ ඈතටත් පැතිරෙනව. ජීවන විමුක්තිය හොයන ආගමික කලාපයත් මෙතනට සම්බන්ධයි. ක්‍රි.පූ. 6 වෙනි සියවසේදි භාරත පොළොවෙ සිද්ධ වෙන බුදුන්ගෙ ආගමනය මේ ඓතිහාසික සාකච්ඡාවට තීරණාත්මක හැඩයක් ලබාදෙනව. ඊට ටිකක් කිට්ටුවෙන් වගෙ ග්‍රීක පොළොවෙ තේල්ස්... ඊ ළඟට සොක්‍රටීස්, ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් වැඩ කරන කාල තීරුවත් සැහෙන්න වැදගත්. ඔය අතරෙ මානව ශිෂ්ටාචාරය විවිධ යුග හරහා තව දුරටත් විකාශය වෙනව. ඒ ඒ යුගවල ශිෂ්ටාචාරගත හැඩය සහ විශේෂයෙන්ම සාමූහිකත්වය අහෝසි වෙමින් - වෙනස් නිෂ්පාදන මාදිලි හරහා සූරාකෑම සංවිධානගත වෙනකොට මේ දාර්ශනික තලයේ සොයා බැලීම එක්තරා ආකාරයක දේශපාලන මෙවළමක් බවට පත්වෙනව. දැනුම අඩුකම ඇතුළු තවත් ඓතිහාසික හේතු නිසා මුල් කාලයෙ මිනිස්සු ඇති කරගත්ත පරාරෝපණයත් ඔය වෙන කොට හොඳ පාලන මෙවළමක් බවට පත්වෙනව. ලෝකය නිර්මාණය කරන්නෙ දෙවියො, රට පාලනය කරන්නෙ දෙවියන්ගෙ පුත්‍රයා හෝ නියෝජිතයා. දේශපාලනය තමයි දේව කැමැත්ත. ඔන්න සමීකරණය. රෝදය හොයා ගැනීම සහ ඉන් පසුව ඇරඹෙන කාර්මික අවධිය වෙන කොට අර කලින් කියපු දාර්ශනික තලයේ සාකච්ඡාවත්, ක්‍රමානුකූලව සහ ඍජුව දේශපාලනික උවමනාවන් සඳහා සංවර්ධනය වෙන්න පටන් ගන්නව.

දේවත්වය සහ දේශපාලනය එකට සූත්‍රගත කිරීමට උත්සහ කරන ජ්‍යෙෂ්ඨ මාටිං ලූතර් කිං සහ පසුව සම්භාව්‍ය ජර්මානු දර්ශනවාදය ඔස්සෙ මනෝමූලික කියවීමක් හරහා, පවතින තත්ත්වය ආරක්ෂා කෙරෙන සහ වෙනස් යහපත් ලෝකයක් ගොඩනගාගැනීම ගැන තර්ක කරන ජෝර්ජ් හෙගල් මුණගැහෙන්නෙ මේ සාකච්ඡා කලාපයෙදි තමයි. 19 වැනි සියවසේ මැද හරියෙදි තම අධ්‍යයන කටයුතු පුළුල් කරන කාල් මාක්ස් ලෝක ඉතිහාසය දේවත්වයෙන් කඩාගෙන භෞතික සන්දර්භයක් ඇතුළෙ විග්‍රහ කරන්න පටන් ගන්නව. වඩා යහපත් අකාරයකට ලෝකය වෙනස් කිරීම ගැන මාක්ස් ඉදිරිපත් කරන ප්‍රවාදය මානව ශිෂ්ටාචාරයෙ පරිණාමයට සෑහෙන බලපෑමක් එල්ල කෙරුව. ඔහු ඉන්නෙ, ප්ලේටෝගෙ ජනරජ යුතෝපියාවට මුළුමනින් ම වෙනස් ප්‍රායෝගික වැඩ

බිමක. 19 සහ 20 වෙනි සියවස් දෙකේදී ලෝකය පුරා පැතිරිච්ච, ලෝකය වෙනස් කිරීම පිළිබඳ බොහෝ අරගලවලට මෙතන සම්බන්ධයි.

ඊ ළඟට ඔන්න ලෝකය වෙනස් කිරීම පිළිබඳ සමස්ත අරගලය පශ්චාත් පරීක්ෂාවකට ලක්කෙරෙන තවත් දාර්ශනික දැනුම් පද්ධති ගොඩනැගෙනව. ඒව හුගක් වෙලාවට අර පරණ දේවවාදී දේශපාලනයට ඍජුව හෝ වක්‍රාකාරව සම්බන්ධයි. සරලව කිව්වොත් ඒ ඒ අවධීන්ට අදාළ ධනේෂ්වර නූතනත්වය සාධාරණීකරණය කරන්න තමයි ඒව පෙනී ඉන්නෙ. ඒත් ඒ අතර ප්‍රංශ ඉතිහාසය තුළ ශෝන් පෝල් සාත්‍රෙ සංවර්ධනය කරන සාන්ද්‍රෘෂ්ටිකවාදය සැහෙන්න තීරණාත්මකයි. සාන්ද්‍රෘෂ්ටිකවාදයේ මූලික හරය තමයි කෙනෙකුට තමන් කැමති විදිහට පවතින්න තියෙන අයිතිය, නිදහස. වරණයෙ නිදහස කියල විග්‍රහ කරන්නෙත් ඒක.

එක පැත්තකින් මේ දාර්ශනික එළඹුම හරි වගෙ පේනව. එතකොට තමයි පූර්ව විනිශ්චයන්ට දාව බිහිවෙන මාක්ස්වාදය අභියෝගයට ලක්වෙන්නෙ. ලෙනින්ලගෙ රුසියානු විප්ලවය, මාවෝලගෙ චීන විප්ලවය සහ චේලගෙ ලතින් ඇමරිකානු අරගලය වගෙ ලෝකය වෙනස් කරන්න මිනිස්සු බලගන්වපු හැම සංසිද්ධියක් ම මේ සාකච්ඡා සන්දර්භයෙදි නිකම්ම නිකං මනස්ගාත බවට පත්වෙනව. ලංකාවට අදාළව, පරණ ජවිපෙ සහ එල්ටීටීඊය ඇතුළු එදා මෙදා තුර බිහි වෙච්ච හැම සටන් කණ්ඩායමක් ම පශ්චාත් පරීක්ෂණයකට ලක් කරන්න මෙතනදි පුළුවං. ඉතිහාසය පුරාම එක එක රටවල, ලෝකය වෙනස් කරන්න උත්සහ කරපු හැමෝම ඉතිහාසයෙ ගොදුරු කියල ඔප්පු කරල පෙන්නන්නත් මේ දේශපාලන ප්‍රදේශය හොඳයි.

ඒ විදිහට බැලුවොත් ඓතිහාසික තත්ත්වයන් නිරීක්ෂණය කරල ඊළඟ මොහොත වෙනුවෙන් යෝජනා කෙරෙන කිසිම දෙයක් වලංගු නැහැ. එහෙම නං මේ ඉතිහාස ගලනය සාධාරණ විකාශයක් හැටියට අපි පිළිගන්නවද? ඒකෙම කොටසක් වූ බරපතල සමාජ අසාධාරණයට අපි එකඟද? සාමූහිකත්වය අහෝසි වෙලා පුද්ගලිකත්වය තහවුරු කෙරෙන එක, පුද්ගලික දේපොල අයිතිය හරහා ශ්‍රමය සූරාකන එක, සම්පත් සමව බෙදී නොයාම ඇතුළු භෞතික විෂමතා ඇති කරන එක, ප්‍රාග්ධන උවමනාවන් වෙනුවෙන් නිෂ්පාදන සබඳතා විකාර කර දැමීම සහ ඒ ඔස්සෙ 'හැමදේම විකුණනවා, විකිණෙනවා' කියන වෙළඳපොළ නූතනත්වය හරහා ජෛව ගෝලයම අභියෝගයට ලක් කරන එක, ගැටුම් නිර්මාණය කර කර උනුන් මරා ගන්න ඉඩ ඇරල ටික දෙනෙකුගෙ පැවැත්ම සහතික කරගන්න හදන එක, ලෝකයෙ සීමිත සම්පත් අයිති කරගෙන ටික දෙනෙක් විතරක් පවතින්න උත්සහ කරන එක, මේ ඓතිහාසික කාලාවකාශය ඇතුළෙ එකා බැගින් එකා වශයෙන් පැවැත්ම අහෝසි වෙලා යන එක... මේ හැම දේම අපි පිළිගන්නවද? අනෙක් අතට අපිට දිගටම මෙහෙම පවතින්න පුළුවංද?

සාන්ද්‍රෘෂ්ටිකවාදය ඇතුළෙ මේ ප්‍රශ්නවලට උත්තර හොයන්න ගත්තොත් 'අවස්ථානුකූලව ඒවාට මුහුණ දීම' තමයි වැඩේ ගොඩ දාගන්න ක්‍රමය හැටියට තෝර ගන්න වෙන්නෙ. මේ ඓතිහාසික දාර්ශනික කැපුම, කරන කියන දේවල් ගැන ආපිට හිතන්න අපිව පොළඹවනව තමයි, ඒත් එතන මාර ප්‍රශ්නයක් තියෙනව.

ඔන්න එතකොට, ආර්ථික පාදම අධෝ ව්‍යුහය විදිහට අරගෙන, ඒ මත පැනනගින උපරි ව්‍යුහය විදිහට මිනිස් සබඳතා ඇතුළු සංස්කෘතික තත්ත්වයන් විග්‍රහ කරනවා කියන චෝදනාවට ලක් වෙන මාක්ස්, ග්‍රාම්ස්චි ඉස්සරහ ප්‍රශ්න කිරීමකටත් ලක් වෙනව. ග්‍රාම්ස්චි කියන්නෙ, ඒක එහෙම වුණත් ව්‍යුහ දෙකකට බෙදල පෙන්නන්න පුළුවන් තරමට ම ඒක තාක්ෂණික නැහැ කියල. ඔහුගෙ සාකච්ඡාව ඇතුළෙ මේ ව්‍යුහ දෙකම ගැනෙන්නෙ එක සංකීර්ණයක් හැටියට. පශ්චාත් මාක්ස්වාදය කියල ඉස්සරහට යන්නෙ මෙන්න මේ අධ්‍යයන කලාපය තමයි. හැබැයි ඒක, මාක්ස්වාදය බාගෙට කියවපු අයගෙ දේශපාලන හිතළුවක් කියල තර්ක කරන අයත් ඉන්නව. මොකද, මාක්ස් අර කියන අධෝ සහ උපරි කියන ව්‍යුහ දෙක වෙන් කරල කතා කෙරුවට ඒ අතර සම්බන්ධතාව හුදු තාක්ෂණික සිද්ධියක් විදිහට විග්‍රහ කරල නැති නිසා. තවත් පැත්තකින්, මාක්ස්වාදය යෝජනා කරන ඉතිහාසයෙ චලනයෙ නීතීන් පවතිනවා කියන ඓතිහාසික අනිවාර්යතාව විතරක් නෙවෙයි, ඊට එරෙහිව පශ්චාත් මාක්ස්වාදීන් යෝජනා කරන 'එය එසේ නොවේය' කියන ප්‍රවාදයත් මේහරියෙදි ම අභියෝගයට ලක් කරන්න අපිට පුළුවං. එතකොට - ඒ දේශපාලන කතිකාව ඇතුළෙ එන 'මිනිස් මැදිහත්වීම මගින් ඉතිහාසය වෙනස් කළ හැකියි හෝ නොහැකියි' කියන ප්‍රවාදවලත් අලුත් මාන මතු වෙනව.

ඊළඟට මනෝවිශ්ලේෂණය හරහා අපට අභිමුඛ වන, මිනිසා නම් වූ දේශපාලන ප්‍රපංචයෙ මානසික කපා බැලීම අපිව තවත් දිශාවකට හරවන්න උත්සහ කරනව. මිනිස් ආශාව, මිනිස් ආශාවේ සුලමුල, මිනිස් ආශාවේ පැතිරීම... ඔස්සෙ සමාජ පරිණාමය පරීක්ෂා කර බැලීම තමයි මේ කලාපයෙදි මූලික වශයෙන් කෙරෙන්නෙ.

එක පැත්තකින් මේ ප්‍රදේශවලදි මාක්ස් විසංයෝජනයට ලක් කෙරෙනව. හැබැයි එතකොට ජෝෂ්ඨ කිං වගේම හෙගල් වගෙ අයත් හෙමින් ඔළුව උස්සල බලන තත්ත්වයකුත් අපිට පේනව. දේශපාලනය ආගමිකකරණය කෙරෙන, ඉතිහාසය සරල රේඛාවක් විදිහට අරගෙන ආපස්සට හරවන ගතියක් එතකොට එතන ඇති වෙනව.

හැබැයි මෙතනදි පැන නගින බරපතලම ප්‍රශ්නය තමයි, අර කලින් කිව්ව වගෙ ලෝකය වෙනස් කිරීමට අදාළ මේ හැම දාර්ශනික සාකච්ඡාවක් ම ඉස්සරහට එන්නෙ ධනේෂ්වරයෙ

පැවැත්ම තහවුරු කරන්නද කියන එක. එතකොට කවුරු හරි කියන්න පුළුවං 'ධනේශ්වර' කියල කරන වෙන් කිරීම ම මාර අවුලක් කියල. ඔව්, අපිට ඒ වගෙ දේවල් ගැනත් දිගින් දිගට කතා කරන්න පුළුවං. ඒත්, ඒක එහෙම නිසා මොකුත්ම කරල වැඩක් නැහැ, මේක තමයි යන විදිහ වගෙ අදහසක්, එහෙමත් නැත්තං සමාජ මනෝභාවයක් මේ ඔස්සෙ සමාජගත වෙනව නං ඒක ඊටත් වඩා මාර ප්‍රශ්නයක් නෙවෙයි ද? 'දොර බාගෙට ඇරල සමානයි, දොර බාගෙට වහල' නිසා දොර ඇරල තියන්න කියල හොරුන්ට ගෙට රිංග ගන්න ඉඩ හදල දෙනව වගෙ සරල කතාවක් මෙතෙන්ට සම්බන්ධ කරන්න පුළුවං.
එරෙහිවීම = එකඟවීම කියන දාර්ශනික සමීකරණය යොදා ගෙන ඕන්නං ඒ වැඩේ කාටහරි නියමෙට ම කරන්න පුළුවං.

ආපිට මුලට ගියොත් 'උඹ කවුද? මොනව ද උඹට ඕන?' කියල අහන ප්‍රශ්නවලින් 'කූඹි' කතාව පටන් ගන්න දැන් පුළුවං. මොහොතකට, භෞතිකයෙ සංකල්ප ලෝකයට ගිහිං මේ ප්‍රශ්න 'චාපා' නම් වූ මට ආදේශ කෙරුවොත්, මම මොකෙක්වත් නෙවෙයි. හැබැයි ජෛව ගෝලයෙ කොටසක් වෙච්ච පලියට, සාමූහිකව පවතින්න සිද්ධ වෙච්ච පලියට මම කූඹියෙක් නං නෙවෙයි. මොකද, මම ශිෂ්ටාචාරගත වෙච්ච සතෙක්, මිනිහෙක්. කූඹියාට නැති හිතීමේ හැකියාවක්, තීරණ ගැනීමේ හැකියාවක් වගෙම හෘදය සාක්ෂියකුත් මට තියෙනව. ඉතිං මට (අපිට) නිකං ඔහේ බලාගෙන ඉන්න බැහැ. ලෝකය වඩා යහපත් තැනකට පරිවර්තනය කරන්න පුළුවං විදිහක් ගැන අපිට හිතන්න වෙනව. පෘථිවියෙ හැම කලාපයකම ජීවත් වෙන මිනිස්සුන්ට සම්පත් සමානව බෙදෙන, ඒ නිසාම මිනිස්සු එකට හිනාවෙන, දියුණු නිෂ්පාදන මාදිලියක් තුළ නවමු සමාජ සබඳතා ගොඩනැගෙන, ජෛව ගෝලයෙ සමතුලිතතාව පවත්වාගෙන යන්න පුළුවං විදිහක් ගැන; කොටින්ම මානව ශිෂ්ටාචාරයෙ අළුත් හැරවුමක් හදාගන්න අපිට යම් උත්සහයක් ගන්න පුළුවං. මේක සාමූහික වැඩබිමක් පිළිබඳ යෝජනාවක්. කූඹි නෙවෙයි නිසාම අපිට මේ ගැන සාකච්ඡා කරන්න පුළුවං. කවුරු හරි මේක ෆැන්ටසියක් පිළිබඳ සාකච්ඡාවක් නේද කියල කිව්වොත්, නෑ මේක හීන හැබෑ කරගන්න හදන වැඩ බිමක් කියල උත්තරයක් ගොනු කරන්න පුළුවං. එතකොට ඔන්න හීන ගැන වෙනම කතාවක්. හීනයක අයිතිකාරයා කවුද? හීන කවුරු වෙනුවෙන් කවුරු දකින ඒවද? හීන විචාරය පිළිබඳ නිර්නායක මොනවද? කොහොමත් කූඹින්ට නං හීන පේන්නැතුව ඇති.

'නිදහස්' ප්‍රකාශනයක් විදිහට මුලින්ම ප්‍රකාශයට පත් වෙච්ච 'ඊළඟට...' පොත පටන් ගන්න හරියෙදි අපි කිව්ව දේශපාලනය කියන්නෙ ඌරගෙයි මිනිහගෙයි බෙදුම් රේඛාව කියල. දැන් ඌර වෙනුවට කූඹිය ඉස්සරහට ගන්නෙ, සිමොන් ද බෝවා නිසා වගෙම 'පොදු පැවැත්ම' වෙනුවෙන් සිමොන්ට එදිරිවත් කූඹියා පෙනී ඉන්න නිසා. ඔය අස්සෙ අහම්බෙන් වගෙ රාවය පත්තරේ 'කූඹියා' කියල කොලමක් පටන් අරගෙන තැනකදි මේ සාකච්ඡාවට ම වටෙන් වටෙන් ඇවිත් සම්බන්ධ වෙන හැටිත් ඉස්සරහට අපිට කතා කරන්න පුළුවං.

කොහොම හරි ගෙවී ගිය දහ අවුරුද්දකට කිට්ටු කාලය පුරා 'නිදහස්' ගොඩනගන දේශපාලන ක්‍රියාවලිය, එතනදිම පුළුල් සංවාද වැඩ බිමක් බවට පත් වෙනව කියලත් යෝජනා කරන්න අපිට පුළුවං. ජනමාධ්‍ය වගෙ නාමකරණයකට අදාළ වුණත් මේ වැඩේ මාධ්‍ය භාවිතයක් ම නෙවෙයි. වෙළඳපොළ ප්‍රකාශන යාන්ත්‍රණය විදිහට යොදා ගන්න 'ජනමාධ්‍ය' කියන සන්නිවේදන අවකාශය මහා දේශපාලන සංවාද වැඩබිමක තීරණාත්මක කොටසක් බවට පෙරළගන්න පුළුවංද?

මේ සටහන් පෙළ අන්න ඒ අත්හදා බැලීම ගැනයි!

**කුමාර චාපාබණ්ඩාර**
2010 ජුනි